රුහුණ විශ්වවිද්‍යාලය

2018/2019 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි 2000 ස්ථලය

දෙවන සමාසික පරීක්ෂණය - 2020 මාර්තු

## SLS 22573 - සම්භාව්‍ය සිංහල පද්‍ය සාහිත්‍යය

**පළමු ප්‍රශ්නය ඇතුළු ව** ප්‍රශ්න **හතරකට (04)කට** පිළිතුරු සපයන්න.

නොපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කෙරේ.

කාලය: පැය 03 යි.

---

01. පහත සඳහන් පද්‍යවල අර්ථ ලිහිල් බසින් ලියන්න.

i)

"පත් ම අත් කුල කැත් දිමුත් හර පත් පදත් වර රත්න වත්තම
රත් නෙතත් දිගු අත් යුගත් පැහැපත් ගතත් යහපත් සෙ සිත්තම
පත් ම වත් වත පත් මහත් සිරි යුත් පසත් පැරකුම් රජුත්තම
සිත් සැපත් ලැබ සත් තොසත් කර සිත්මිණෙව් පවතින්න නිත්තම"

ii)

"සබඳ දෙරණ ගන දැරුමෙහි නත පණිපති පුන්දරා
සරද සමය උදිත නිමල හිමකර යසැති සුන්දරා
සමද වයිර රාජ සමර ජලනිදි මතන මන්දරා
සැරද පවර පැරකුම්බුජ රජ මුනිපුද පුරන්දරා"

පැරකුම්බා සිරිත (සංස්.). සිරි තිලකසිරි

iii)

"සතොස් කරණ විණා නද ඇසුම ට
නොගොස් සිටින පිල්බර ගණ ගොදුර ට
වෙසෙස් රුවින් තම මැව්වත් බඹහ ට
සැඳැස් සවන් නොකළැයි වූ නොසතු ට"

iv)

"නිති නිරිඳුගෙ රැකවලෙහි නියු ත්තෝ
රුති ලෙස රුපුනොද බිඳ ජයග ත්තෝ
පැති රෙන වෙණනද බැඳුණු සිතැ ත්තෝ
අති නවි ගිලිහෙන බව නොමද ත්තෝ"

ගුත්තිල කාව්‍ය වර්ණනා. (සංස්.) ඩබ්ලියු. ඇෆ්. ගුණවර්ධන

v)

"හමළ නෙලෙ සරා සරා සිසි සොමි ඉසිලී
සිලී ගිරරඟනි මියුරු මියුරු සර ලී හස් කැන්"

vi)

"ලියගුම්හි යොනක් පුළුලුකුලු හිමි දිස්නා
පලන් මෙද කුසුම් කැන් ලියකිඳුරු සිරි හා ගත්"

(**කව්සිළුමිණ**, ඇම්. බී. ආරියපාල (සංස්) 457, 482 ගී)

vii)

| | |
|---|---|
| "නුබ මිණි කුල කිරුළු අග රඟමිණෙ'වි | යෙදූ |
| නව මිණි දෙරණිසුරු රජ කුමරුවන් | ලදූ |
| ගුණ මිණි අනගි අබරණ පැලඳි | පිරිසිඳු |
| ලිය මිණි බිසෝ හිමි රජ කුල සිරින් | සැදූ" |

viii)

| | |
|---|---|
| "කිරණ විහිදි පහකුළු තුඟු කොතින් | සැදූ |
| නරණ ලියෙ'වි පිය ලන පිය ලියන් | රැඳූ |
| දෙරණ තුසුලන මෙන් සව් සිරින් | යෙදූ |
| කලණ සිරින් පිරි මහ කැලණි පුර | වදූ" |

(**මයූර සන්දේශය**, කුමාරතුංග මුනිදාස (සංස්.) 17, 34 පද්‍ය)

02. සසදාවතෙහි ඇතුළත් සෘතු වර්ණනයේ හා පුර වර්ණනයේ භාවිත අලංකාරවල උචිතානුචිත බව අභිමත උදාහරණ 04ක් වත් ඇසුරෙන් පහදන්න.

03. "අව්‍යාජ අදහස් ප්‍රකාශනය සීගිරි ගී අධ්‍යයනයේ දී දැකගත හැකි ප්‍රධාන ලක්ෂණයකි." ඒ සඳහා බලපෑ හේතු හා එම ගීවල ඇති විශේෂතා පිළිබඳ විමර්ශනයක යෙදෙන්න.

04. උපදේශ සාහිත්‍යය පිළිබඳ පැහැදිලි කරමින්, යහපත් රාජ්‍ය පාලනයක් සඳහා අවශ්‍ය උපදෙස් 'සුභාෂිතයෙහි' දක්වා ඇති ආකාරය නිදර්ශන සහිත ව සාකච්ඡා කරන්න.

05. "එක ම වස්තුවිෂය බහුවිධ චිත්තරූප මැවෙන සේ වර්ණනා කිරීමට බුදුගුණ අලංකාර කවියා සමත් ව ඇත." විශාලා මහනුවර දුර්භික්ෂ සමයට පෙර සහ පසු අවස්ථා උපයෝගී කරගනිමින් තුලනාත්මක ව විග්‍රහ කරන්න.

06. කව්සිළුමිණ කවියා මහාකාව්‍ය ලක්ෂණවලට අනුගතව සිය කාව්‍යය රචනා කර ඇති අයුරු නිදසුන් මගින් පෙන්වා දෙන්න.

07. මයූර සන්දේශකරුවාගේ වර්ණනා චාතුර්යය ස්වභාව සෞන්දර්ය වර්ණනා ඇසුරින් පහදන්න.

**(අනිවාර්ය ප්‍රශ්නයේ පිළිතුරු සඳහා ලකුණු 24ක් ද, අංක 2-7 දක්වා පිළිතුරු සඳහා ලකුණු 12 බැගින් ද හිමි වේ.)**

@@@@@@@@@@@